# 2022.02.03 දිනැති ගැසට් නිවේදනය සංශෝධනය කිරීම

## කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව

2022.02.03 වැනි දින ප්‍රකාශයට පත් කරන ලද අංක 2266 දරන *ගැසට් පත්‍රයේ* පළකල කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව යටතේ ඇති තාක්ෂණ හා කාර්මික විද්‍යාලවලට 2022 වසර සඳහා සිසුන් ඇතුළත් කරගැනීම සඳහා වූ *ගැසට්* නිවේදනයට පහත සඳහන් සංශෝධනයන් සිදු කෙරේ. ：

එස්. සී. ජගත්,
අධ්‍යක්ෂ ජනරාල්.

සංශෝධන ：

01. පොදු කොන්දේසි යටතේ අංක 12 වගන්තිය

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිසම මගින් පවත්වනු ලබන පොදු විභාගයේ ගාස්තුව රු. 500 ලෙස සංශෝධනය කෙරේ.

02. ඇතුළත්වීමේ සුදුසුකම් සංශෝධනය

(අ) ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම් 5/6 (NVQ 5/6) පූර්ණ කාලීන ඩිප්ලෝමා පාඨමාලාවන්ට ඇතුළත් වීමේදී NVQ 3/4 සුදුසුකම සමග එක් වසරක පළපුරුද්ද ඉල්ලා ඇති පාඨමාලාවල එක් වසරක පළපුරුද්ද ඉවත් කෙරේ. ඒ අනුව NVQ 3/4 සුදුසුකමෙන් ඇතුළත්වීමට අපේක්ෂා කරන අයදුම්කරුවන් හට පළපුරුද්ද අවශ්‍ය නොවේ.

03. සෑම පාඨමාලාවක් සඳහාම බඳවා ගැනීමේ වයස 2022.01.01 දිනට වයස අවු. 17ට වැඩි විය යුතුය.

04. සිංහල, ඉංග්‍රීසි සහ දෙමළ මාධ්‍ය *ගැසට්* නිවේදන අතර වෙනසක් ඇතොත් සිංහල *ගැසට්* නිවේදනය බලාත්මක වේ.

05. බඳවා ගැනීමේ සුදුසුකම් ලෙස NVQ 3/4 සුදුසුකම් සළකා බැලීමේදී NVQ 4 සුදුසුකම් ලබා ඇති සිසුන් සඳහා ප්‍රමුඛත්වයක් ලබා දෙනු ලැබේ.

06. දෙවන භාෂාවක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ ඩිප්ලෝමා සඳහා ඇතුළත් වීමේ සුදුසුකමක් වන අ.පො.ස. (උ.පෙළ) විභාගයේදී සාමාන්‍ය ඉංග්‍රීසි විෂයය සඳහා සාමාන්‍ය සාමාර්ථයක් නොව සම්මාන සාමාර්ථයක් තිබිය යුතුය.

07. කාර්යාල කළමනාකරණ ක්ෂේත්‍රයට BCS 06 යටතේ ලේකම් පරිචය පිළිබඳ ජාතික සහතිකය පාඨමාලාව අනු අංක 72A ලෙස අලුතින් ඇතුළත් කෙරේ.

| *අනු අංකය* | *පාඨමාලා කේතය* | *පාඨමාලාවේ නම හා ස්වභාවය* | *ඇතුළත්වීමේ සුදුසුකම්* | *පාඨමාලා මාධ්‍ය/ NVQ මට්ටම සහ පැවැත්වෙන තාක්ෂණ විද්‍යාල/කාර්මික විද්‍යාල* |
|---|---|---|---|---|
| 72 A | BSC 06 | ලේකම් පරිචය පිළිබඳ ජාතික සහතිකය<br>පූර්ණ කාලීන<br>දිවා මාස 18<br>(කර්මාන්තගත පුහුණුව මාස 06 ඇතුළත්වේ.) | 1. දෙවරකට නොවැඩි වාර ගණනකදී මාධ්‍ය භාෂාව හා ගණිතය ඇතුළුව අ. පො. ස. (සා. පෙළ) විභාගයේ විෂයයන් හයකින් (06) සාමාර්ථය ලබා තිබීම සහ ඉංග්‍රීසි භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් තිබිය යුතුය.<br>i. අයදුම්කරුවන්ගේ ඉංග්‍රීසි භාෂාමය ප්‍රවීණතාවය (කථා කිරීම, ලිවීම) කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.<br>ii. අවශ්‍යතාවය මත ඉංග්‍රීසි භාෂාමය ප්‍රවීණතාවය පරීක්ෂා කිරීම සඳහා ලිඛිත පරීක්ෂණයක් පවත්වනු ලැබේ.<br>2. 2022.01.01 දිනට වයස අවු. 17ට වැඩි විය යුතුය. | *ඉංග්‍රීසි මාධ්‍ය*<br>*NVQ මට්ටම් 4*<br>යාපනය, බදුල්ල, ගාල්ල, මහනුවර, මරදාන, මඩකලපුව, ගම්පහ, හෝමාගම, කලුතර, කෑගල්ල, කුළියාපිටිය, මාතලේ, සම්මන්තුරය, බලපිටිය |

08. පහත සඳහන් කේත අංකවලින් දැක්වෙන අර්ධකාලීන පාඨමාලා සඳහා දක්වා ඇති ඇතුළත්වීමේ සුදුසුකම්වලට අමතරව පහත සඳහන් සුදුසුකම් ද ඇතුළත් කෙරේ. :

| *අනු අංකය* | *පාඨමාලා කේතය* | *පාඨමාලාවේ නම හා ස්වභාවය* | *අමතර ඇතුළත්වීමේ සුදුසුකම්* |
|---|---|---|---|
| 95 | ETC 01.1 | ඉදිකිරීම් තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව (ජාතික තාක්ෂණ සහතිකය - සිවිල් ඉංජිනේරු) | දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් භාෂා මාධ්‍ය (සිංහල/දෙමළ/ඉංග්‍රීසි), ගණිතය, විද්‍යාව සහ වෙනත් විෂයන් තුනක් ඇතුලුව විෂයන් 6 කින් සමත්ව තිබීම, සහ මෙම |

| අනු අංකය | පාඨමාලා කේතය | පාඨමාලාවේ නම හා ස්වභාවය | අමතර ඇතුළත්වීමේ සුදුසුකම් |
|---|---|---|---|
| 83<br><br>101<br><br><br><br>104<br><br><br><br>105 | ETC 02.1<br><br>ETC 04.1<br><br><br><br>ETC 08.1<br><br><br><br>ETC 09.1 | විදුලි තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව (ජාතික තාක්ෂණ සහතිකය - විදුලි හා විද්‍යුත් ඉංජිනේරු (NCT electrical and electronic)<br><br>ප්‍රමාණ සමීක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාව (ජාතික තාක්ෂණ සහතිකය - ප්‍රමාණ සමීක්ෂණ)<br><br>නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව (ජාතික තාක්ෂණ සහතිකය (NCT) - යාන්ත්‍රික ඉංජිනේරු - නිෂ්පාදන තාක්ෂණය)<br><br>මෝටර් රථ තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව (ජාතික තාක්ෂණ සහතිකය - යාන්ත්‍රික ඉංජිනේරු ( NCT mechanical Automobile) | සුදුසුකම් මත බඳවාගනු ලබන සිසුන් පාඨමාලාවේ දෙවන වසර අවසන් වීමට පෙර අදාළ විෂයය ක්ෂේත්‍රයෙන් NVQ 4 සුදුසුකම් ලබාගැනීම අනිවාර්ය වේ. |

09. අනෙකුත් සංශෝධන :

| අනු අංකය | පාඨමාලා කේතය | සංශෝධනය විය යුතු ආකාරය |
|---|---|---|
| 06 | A 01S018 | මෙම පාඨමාලාවේ නම ශාක පටක රෝපණ පර්යේෂණාගාර සහකාර ලෙස වෙනස් කෙරේ. |
| 23 | F 45S004 | ලී වැඩ කාර්මික (ගොඩනැගිලි) පාඨමාලාව NVQ 3 මට්ටම පැවැත්වෙන ස්ථානයක් ලෙස ත්‍රිකුණාමලය කාර්මික විද්‍යාලයද ඇතුළත් විය යුතුය. |
| 34 | F 45S006<br>(ECC 78) | ඉදිකිරීම් ක්ෂේත්‍ර පරීක්ෂකවරුන් සඳහා වූ ජාතික සහතිකය පාඨමාලාවේ කාලය පූර්ණකාල දිවා මාස 18 (කර්මාන්තගත පුහුණුව මාස 6ක් ඇතුලත්ව) ලෙස සංශෝධනය කෙරේ. මෙහි පාඨමාලා කේතය ECC 78 ලෙස වෙනස් කෙරේ. |
| 47 | ECC 08 | ඉංජිනේරු ශිල්පීය පුහුණුව පිළිබඳ ජාතික සහතිකය - (ඉලෙක්ට්‍රොනික්) පාඨමාලාව NVQ මට්ටම් 4 පැවැත්වෙන ස්ථානයක් ලෙස මරදාන තාක්ෂණ විද්‍යාලය ද ඇතුළත් විය යුතුය. |
| 49 | E40S001 | විදුලි කාර්මික ශිල්පී පාඨමාලාවේ NVQ 3 මට්ටම සඳහා ඇතුළත්වීමේ සුදුසුකම 09 ශ්‍රේණිය සමත් වී තිබීම ලෙස හා NVQ 4 මට්ටම් සඳහා ඇතුළත්වීමේ සුදුසුකම දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. (සා.පෙළ) විභාගයේ විෂයයන් හයකින් (06) සමත්ව තිබීම ලෙස සංශෝධනය කෙරේ. |
| 53 | I-64S001 | විදුලි සංදේශ කාර්මික ශිල්පී පාඨමාලාවේ කර්මාන්තගත පුහුණුව මාස 12 ලෙස සංශෝධනය කෙරේ. |
| 62 | ECC 26 | කළුතර කාර්මික විද්‍යාලයේ පැවැත්වෙන යන්ත්‍රණය පිළිබඳ සහතික පාඨමාලාවේ NVQ මට්ටම් 3 වෙනුවට NVQ මට්ටම් 4 ලෙස සංශෝධනය විය යුතුය. |
| 75 | D29S002 | ශීතකරණ හෝ වායුසමන ශිල්පී පාඨමාලාව NVQ 3 මට්ටම පැවැත්වෙන ස්ථානයක් ලෙස ත්‍රිකුණාමලය කාර්මික විද්‍යාලය ද ඇතුළත් විය යුතුය. |
| 83 | ETC 02.1 | විදුලි තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවේ ඇතුළත්වීමේ සුදුසුකම්.<br>අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් විෂයයන් 03කින් එකවර සමත් වීම (GIT සහ සාමාන්‍ය ඉංග්‍රීසි හැර) ලෙස සංශෝධනය විය යුතුය. |

| අනු අංකය | පාඨමාලා කේතය | සංශෝධනය විය යුතු ආකාරය |
|---|---|---|
| 86 | ETB 29 | වායු හා ද්‍රව පීඩන තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාවේ පාඨමාලාවේ ඇතුළත්වීමේ සුදුසුකම පහත ලෙස සංශෝධනය විය යුතුය. :<br><br>1. අදාළ ක්ෂේත්‍රයේ NVQ මට්ටම් 3 හෝ 4 සහතික ලබා තිබීම. (මෙහිදී අදාළ ක්ෂේත්‍රයේ, වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා NVQ මට්ටම් 4 ලබා ඇති සිසුන් හට ප්‍රමුඛතාවය ලබාදෙනු ලැබේ.)<br>හෝ<br>අ.පො.ස.(උ.පෙළ) ඉංජිනේරු තාක්ෂණවේදය/ගණිතය/විද්‍යාව යන විෂයධාරාවන්ගෙන් අවම වශයෙන් විෂයයන් තුනක් සමත් වී තිබීම. (GIT සහ සාමාන්‍ය ඉංග්‍රීසි හැර)<br>හෝ<br>අ.පො.ස. (උ.පෙළ) කලා විෂය ධාරාවේ දෘඩ තාක්ෂණය (Hard Technology) යටතේ වූ විදුලි තාක්ෂණය (Electrical Technology), විද්‍යුත් තාක්ෂණය (Electronic Technology), යාන්ත්‍රික තාක්ෂණය (Mechanical Technology) තොරතුරු තාක්ෂණය (ICT) යන විෂයන් අතුරින් එක් විෂයක් සඳහා සම්මාන සමාර්ථයක් සහිතව විෂයන් තුනක් සමත් වී තිබීම.<br><br>2. 2022.01.01 දිනට වයස අවු. 17 නොඅඩු විය යුතුය. |
| 95 | ETC 01.1 | ඉදිකිරීම් තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව (ජාතික තාක්ෂණ සහතිකය - (සිවිල් ඉංජිනේරු)) පාඨමාලාව මට්ටම පැවැත්වෙන ස්ථානයක් ලෙස බලපිටිය කාර්මික විද්‍යාලයද ඇතුළත් විය යුතුය. |
| 111 | ETB 11 | තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව බඳවා ගැනීමේ සුදුසුකම අදාළ ක්ෂේත්‍රයේ NVQ මට්ටම් 3 හෝ 4 සහතික ලබා තිබීම ලෙස සංශෝධනය කෙරේ. අනෙකුත් බඳවා ගැනීමේ සුදුසුකම් නොවෙනස්ව පවතී. |
| 121 | ETA 22 | සමුද්‍රීය හා සැපයුම් කළමණාකරණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව පාඨමාලාව NVQ මට්ටම් 5/6 ඒකාබද්ධ ලෙස හා පාඨමාලා කාලය අවුරුදු 2 ½/දිවා/පූර්ණ කාලීන ලෙස සංශෝධනය කෙරේ. (කර්මාන්තගත පුහුණුව මාස 06 ද ඇතුළත්ය) |